# ඥාන මීමාංසාවට පෙරවදනක්

**ආචාර්ය දිල්ශාන් මනෝජ් රාජපක්ෂ**

## 1. දර්ශනය

ඥාන මීමාංසාව යන්න සාකච්ඡා කිරීමේ දී ඊට වඩාත් ම සමීපත ම තවත් ප්‍රධාන තේමාවකින් විශේෂ ප්‍රවේශයක් ලබාගත හැකි ය. එනම්, දර්ශනය යන ප්‍රධාන විෂය තේමාව යි. 'දර්ශනය' යන්න සඳහා ඉංග්‍රීසි භාෂාවේ යෙදෙන්නේ (Philosophy) යන්න යි. මෙය ග්‍රීක භාෂාවේ Philosophia යන වදනින් තැනී ඇති අතර මෙම යෙදුම Philo iy Sophia යන වචන දෙක ඇසුරෙන් තැනුනකි. මෙහි Philo නම් යහළුවා, මිත්‍රයා, හිතවතා යන අර්ථ මෙන් ම ලැදියාව, කැමැත්ත, ආශාව, පෙලඹීම යන අර්ථ දෙන යෙදුමකි. Sophia නම් ඥානය, බුද්ධිය හා ප්‍රඥාව යි. ඒ අනුව මෙහි සරල අරුත නම් 'ඥානයට ඇති ලැදියාව' (Love of the Wisdom) 'බුද්ධියට ඇති කැමැත්ත' යන්න යි. එසේ ම යමක් දැනගැනීමේ රුචිය යි. දාර්ශනිකයා හැඳින්වීම සඳහා ග්‍රීක භාෂාවේ Sophost යන යෙදුම ද ඉංග්‍රීසි බසින් Philosopher යන යෙදුම ද යොදන්නේ 'ඥානය සොයා යන්නා', 'ඥාන ගවේෂකයා' යන අදහසින් බව පෙනේ. දර්ශනය යන්න පිළිබඳ ව සරල ව දක්වන්නේ නම් 'දර්ශනය යනු දැනීම හා බුද්ධිය පිළිබඳව ගවේෂණයකි'. එමගින් අපගේ අවබෝධය මෙහෙයවීම සඳහා බලපාන මූලධර්ම නිරවුල් කිරීමට අපේක්ෂා කරන අතර ඒවා විස්තර කිරීමට භාවිත කරන භාෂාව විභාග කිරීමට ද ප්‍රයත්න දරයි.[1]

### දර්ශනයෙහි ප්‍රධාන තේමා දෙකකි

1. පුද්ගලයා (තමා හා තම අභ්‍යන්තරය) පිළිබඳ දර්ශනය මෙහෙයවීම
2. ලෝකය (තමාගෙන් පිටත එනම් බාහිර ලෝකය) පිළිබඳ දර්ශනය මෙහෙයවීම යනු යි.

අනාදිමත් කාලයක පටන් මිනිසාගේ බුද්ධිය මුහුකුරා යෑම පෙන්නුම් කරන විෂයය වන්නේ දර්ශනය යි. අතුපතර විහිදී ගිය මහා වෘක්ෂයක් මෙන් දර්ශනය ගැඹුරු පදනමක් මත ප්‍රධාන ධාරා දෙකක් ඔස්සේ විහිදී ගිය බව පෙනේ. එනම්,

1. පෙරදිග දර්ශන සම්ප්‍රදාය (ආසියාතික දර්ශනවාද)

2. අපරදිග දර්ශන සම්ප්‍රදාය (බටහිර හා ඇමරිකානු දර්ශනවාද)

දර්ශනය යන විෂය ක්ෂේත්‍රය තුළ සාකච්ඡා කෙරෙන ප්‍රධාන උපවිෂය කිහිපයකි. මෙය තවත් අයුරකින් දක්වුවහොත් දර්ශනය නම් විෂය පෝෂණය කරන්නා වූ උපවිෂයන් කිහිපයකි. ඒවා නම්,

1. ඥානවිභාගය (Epistemology/Theory of knowledge)

2. ලෝකවිභාගය (Cosmology)

3. අධිභෞතිකවාදය හෙවත් පාරභෞතිකවාදය (Metaphysics)

4. සදාචාර දර්ශනය හෙවත් ආචාරධර්මය (Moral Philosophy/Ethics)

5. සෞන්දර්යය විද්‍යාව (Aesthetics)

6. තර්ක ශාස්ත්‍රය (Logic)[2]

එම උපවිෂයවලින් ඥානය පිළිබඳ සාකච්ඡා කරන විෂය ක්ෂේත්‍රය ඥාන මීමාංසාව යි. ලෝකය පිළිබඳ ඇතිකරන දාර්ශනික කතිකාව ලෝක විභාගය යි. එසේ ම භෞතිකත්වය ඉකමවා ගිය තේමා පිළිබඳ සාකච්ඡා කරන විෂය අධිභෞතිකවාදය යි. මානව හැසිරීම පිළිබඳ ව සාකච්ඡා කරන්නේ ආචාර විද්‍යාවෙනි. සුන්දරත්වය හෙවත් කලාව පිළිබඳ ව සාකච්ඡා කරන්නේ සෞන්දර්ය විද්‍යාවෙනි. භාෂාවේ හැසිරවීම පදනම් කරගත් තේමා සාකච්ඡා කිරීම තර්ක ශාස්ත්‍රයේ විෂය යි. මුල් යුගයේ මනස පිළිබඳ ව සාකච්ඡා කළ මනෝවිද්‍යාව (Psychology) ද දර්ශනයේ උපක්ෂේත්‍රයකි.

## 2. දාර්ශනික ඥාන විභාගය

ඉහත සඳහන් විග්‍රහයෙන් පෙනෙන ප්‍රධාන කරුණු අතුරින් දර්ශනය නම් විෂය පථය ඉතා ගැඹුරු විෂය ක්ෂේත්‍රය ගණනාවකින් සැදුම්ලත් බවත් එම සෑම ක්ෂේත්‍රයකින් ම ඥාන ගවේෂණයක් සිදුවන බවත් පැහැදිලි වේ. මෙය තවත් ආකාරයකින් දක්වුවහොත් දර්ශනය මව් විෂයය මඟින් ද එහි උපවිෂය මඟින් ද සිදුවන්නේ ඥාන ගවේෂණයක් හෙවත් ඥාන විභාගයක් යැයි කීම නිවැරදි ය. එසේනම් ඥානවිභාගය විෂයය විශේෂ වන්නේ ඕනෑ ම විෂයක් මඟින් ඥානය ගවේෂණය වන්නේ හෝ එය කළ යුත්තේ කෙසේදැයි යන්න මතු කරමින් එහි තාක්ෂණික ක්‍රම විද්‍යාව ඉදිරිපත් කරන බැවිනි.

ඥානය (ඤාණය) නම් දැනීම යි. නොහොත් දන්නා බව යි.[3] දැනුම, නුවණ හෙවත් ඥානය පිළිබඳව කරනු ලබන විමසුම ඥාන විභාගය නම් වේ. ඥානය යන යෙදුම සැකසී ඇත්තේ දැනීම් අර්ථය දෙන ඥා (ඤා) ධාතුවෙනි. පාලි භාෂාවෙන් 'ජානාති' යන්න ද සංස්කෘත භාෂාවෙන් 'ජානෙ' යන්න ද ඉංග්‍රීසි භාෂාවෙන් 'Knowledge' යන්න ද ඥානය සඳහා ව්‍යවහාර කරන යෙදුම් ය. ඥානය යන්න සඳහා ඊට සමාන අරුත් දෙන Episteme හා සංජානනය, මතකය හා අනුභූතිය යන අරුත් දෙන Gnosis යන යෙදුම් දෙක ද ග්‍රීක දාර්ශනිකයන් ව්‍යවහාර කර තිබෙන අතර[4,5] ප්ලේටෝ සහ ඇරිස්ටෝටල් යන ග්‍රීක දාර්ශනිකයන් දෙදෙනා ම ඥානය සඳහා මෙම යෙදුම් භාවිත කොට ඇත.

ඥාන මීමාංසාව යන පාරිභාෂික යෙදුම සමානාර්ථවත් කිරීමට ඥාන ගවේෂණය, ඥානවිභාගය, ඥාන හැදෑරීම ආදිය ද භාවිත කෙරේ. එම යෙදුම් දර්ශනය විෂය හදාරන විට නිබඳ ව ම භාවිත වන වචන කිහිපයකි.[6] ඉංග්‍රීසි භාෂාවෙන් මේ සඳහා Epistemology හා Theory of knowledge යන යෙදුම් ව්‍යවහාර කරන මෙහි Epistemology යන යෙදුම සැකසී ඇත්තේ ග්‍රීක භාෂාවේ ඥානය යන්නට යෙදෙන Episteme හා චින්තනය, අදහස, තර්කණය, මූලධර්මය, හේතුව, අනුශාසනය හා සාකච්ඡා කිරීම වැනි අර්ථ ගෙනදෙන logos යන යෙදුම් දෙකෙනි.[7]

දර්ශනයේ පදනම වී තිබෙන්නේ ඥාන ගවේෂණය නැතහොත් ඥානවිභාගය යි. ඥානය හා සම්බන්ධ විමර්ශනය දර්ශනයේ ප්‍රධාන ම කාර්යය බව දර්ශන කාර්යයෙහි බැසගත් දාර්ශනිකයාගේ ද අභ්‍යුපගමනය වන්නේ ය. එනිසා පෙරදිග මෙන් ම අපරදිග දර්ශනයේ ද ඥානයේ සප්‍රමාණතාව පිළිබඳ ගැඹුරින් සාකච්ඡා කරන බවක් පෙනේ.

### 3. ඥානවිභාගය තේරුම් ගැනීම

ඥානවිභාගය තවදුරටත් පර්යාය වශයෙන් ඥාන මීමාංසා යන අරුතැති පරීක්ෂණය, අන්වීක්ෂණය, අන්වේක්ෂණය, විචාරණය යන අරුත්හි යෙදේ.[8] මහාචාර්ය එස්. ජී. එම්. වීරසිංහයන් ඥාන මීමංසාව විස්තර කරන්නේ,

''දැනීම ඇතිවීම, එහි ස්වභාවය යනාදී තේමාවන් විමසා බැලීම එසේ පිරික්සා බලන දර්ශනය හෝ දර්ශන ශාඛාව ඥාන මීමාංසාව යි.''[9]

ඥාන මීමාංසාව ඒකමතික නිශ්චිත හෝ විධිමත් අන්තර්ගතයක් ඇති විෂයයක් නොවන්නේ ය. මිනිසා ඥානය හෙවත් දැනුම ලබා ගන්නේ කෙසේද?, විවිධ මාර්ගයන්ගෙන් ලබන ඥානයේ සප්‍රමාණතාව කවරේද?, යන්න විමසා බැලීම දර්ශන විෂය ක්ෂේත්‍රයට අයත් ඥානවිභාගය යටතේ සිදු වේ.[10]

ඥාන විභාගය යන විෂයේ දී සාකච්ඡා කෙරෙනුයේ පුද්ගලයාගේ දැනුමේ ස්වභාවය, පුද්ගල දැනුම ගොඩනැගෙන ආකාරය, පුද්ගල දැනුමෙහි සීමා කවරේ ද? යන ප්‍රධාන තේමාය.[11] එය අසවල් විෂය හා සම්බන්ධ දැනුම යයි සීමා කළ නොහැකි ය.

ඥාන විභාගය පිළිබඳව විග්‍රහාත්මක විශ්ලේෂණයක් ලබාදෙන කේ. එන්. ජයතිලක මහතා ඥාන විභාගයේ විෂය ක්ෂේත්‍රය විස්තර කරන්නේ මෙසේය. ''ඥානවිභාගය යනු කුමක් ද?, එහි ලක්ෂණ කථනයක් කළ හැකිද?, එසේ ඥානයට හිමි සංකීර්ණ ලක්ෂණ මොනවා ද?, ඥානය පහළ වන්නේ සුවිශේෂ සිතිවිලි වශයෙන් ද?, ඥානයේ අරමුණු කවරේ ද?, ඥානෝපායන්

මොනවා ද?, වඩා වැදගත් වන්නේ ඉන්ද්‍රිය ඥානය ද?, නැතහොත් බුද්ධිමය ඥානය ද?, ප්‍රත්‍යක්ෂයේ ස්වභාවය කුමක් ද?, ඉන්ද්‍රිය දත්ත කුමන වස්තු ද?, මතක ඥානයේ ආකාර හා සප්‍රමාණතාව කුමක් ද?, සාධාරණ ඥානයට ඉවහල් වන සාමාන්‍ය කවරේ ද?, කවර දේවල් ද?, විනිශ්චය යනු කුමක් ද?, විශ්වාසයේ අරමුණු වන ප්‍රස්තුත යනු මොනවා ද?, සත්‍යවාද මොනවා ද? නිවැරදි සත්‍ය වාදය කුමක් ද?, වාගාර්ථය හා ප්‍රස්තුතාර්ථය යනු කුමක් ද?, සාර්ථක ප්‍රස්තුතයන්ගේ හා ව්‍යාජ ප්‍රස්තුතයන්ගේ වෙනස කුමක් ද?, සත්‍යෙක්ෂණ ප්‍රතිපත්තියේ වටිනාකම කුමක් ද?, හේතුඵල රීති නොමැති ලෝකයක් ගැන හා ඥානයක් ඇති කරගත හැකි ද?, ඥානය හා විශ්වාසය අතර සම්බන්ධය හා වෙනස කුමක් ද? යන ප්‍රශ්න නැගීම හා ඒවාට විසඳුම් ඉදිරිපත් කිරීම ඥානවිභාගයේ විෂය ක්ෂේත්‍රයට අදාළ වේ.''[12]

කේ. එන්. ජයතිලක ගෙනහැර දක්වන මෙම විග්‍රහය තුළ ඥාන විභාගයේ දාර්ශනික ප්‍රශ්නවල වැදගත් බව විස්තර වේ. ඥානය හෙවත් දැනීම බිහිවන්නේ කෙසේ ද?, දැනුමේ ස්වභාවය කුමක් ද?, ඥානයේ සීමාවන් මොනවා ද? වැනි ප්‍රශ්න ඉදිරිපත් කරන්නේ දාර්ශනික ප්‍රශ්න ලෙසට ය. දාර්ශනික ඥානවිභාගයීය ප්‍රශ්න ඉතා වැදගත් ගණයේ ප්‍රශ්න ලෙස ගැනෙන්නේ ඒවාට ඍජු ව පිළිතුරු ලබා දීමට නොහැකි වීමෙනි. ගණිත සිද්ධාන්තය තුළ 2+ 2 = 4 යනාදී සරල සෛද්ධාන්තික පිළිතුරු මෙහි දී ලබා ගත නොහැකි බව පෙනේ.

#### 4. ඥාන මීමාංසාවේ අන්තර්ගතය

මේ අනුව දර්ශන විෂයෙහි ඥාන විභාගය පුළුල් ක්ෂේත්‍රයක විසිර පවතින බව පෙනේ. එබැවින් ඥානය තේමා කොට ගෙන නූතනයේ ත්‍රිවිධ විෂයයන් වර්ධනය වී ඇත.

1. ඥානයේ ස්වභාවය (Nature of the knowledge)
2. ඥානයේ විෂය ක්ෂේත්‍ර (Scope of the knowledge)
3. ඥානය පිළිබඳ ක්ෂේත්‍ර (Fields of the knowledge)[13]

කෙසේ නමුත් ඉහත සඳහන් වන ඥාන විභාගයීය විෂයවලට අමතර ව ඥානයේ පරමාර්ථය හා ඥානයේ අරමුණ (හෝ අරමුණු) (Aim of the knowledge) ඥාන මාර්ග (Ways of the knowledge) ඥානයේ සීමා (Limits of the knowledge) යනාදී තේමා ද මෙහි ලා අයත් වේ.

ඥානය යනු කවරාකාර ද, එය අත්විඳිය යුත්තේ කෙසේ ද යන්න ඥානයේ ස්වභාවය තුළින් සාකච්ඡා කෙරේ. ඥානය හා බැඳුණු අවකාශයීය විවිධ විෂයපථ ඥානයෙහි විෂය තුළින් සාකච්ඡා කෙරේ. ඥානයේ අන්තර්ගතය අනුව එහි ක්ෂේත්‍ර ද එසේත් නැතිනම් වෘත්තීය (Profession) ඥානය පිළිබඳ ක්ෂේත්‍රයන්හි දී සාකච්ඡා කෙරෙන අතර ඥානය හුදෙක් ම ඥානය සඳහා ම ද නැතහොත් ඥානය යන්න සාකච්ඡා කොට අපේක්ෂා කරන අරමුණු හෝ ඉලක්ක මෙන් ම පර්මාර්ථ තිබේ ද? එසේ තිබෙන්නේ නම් ඒ මොනවාද යන්න සාකච්ඡා කිරීම ඥානයේ පරමාර්ථය හා ඥානයේ අරමුණ (හෝ අරමුණු) යටතට අයත් වේ. දැනීම ලැබගැනීමට අනුගමනය කරන විවිධ ක්‍රමෝපාය ඥානමාර්ග යටතේ සාකච්ඡා කෙරේ. ඥාන මීමාංසාව තුළ සාකච්ඡා කෙරෙන නැවුම් ප්‍රපංචය ඥානයෙහි සීමා ය.

පෙර අපර දෙදිග දාර්ශනිකයන් පිළිගන්නා ඥානය සම්බන්ධ සිද්ධාන්ත අතුරෙන් ඥානයෙහි සීමා පිළිබඳ ගැටලුව නොයෙක් ආකාරයන්ගෙන් සාකච්ඡා කර ඇත. ඥානයට සීමා පැනවෙන්නේ යම්කිසි බාධාවක් නිසා ය. ඥානයට සීමා පනවන එබඳු බාධක කිහිපයක් හඳුනා ගත හැකි ය. එනම්,

1. ප්‍රායෝගික සීමා
2. නෛසර්ගික සීමා
3. තාර්කික සීමා යනාදිය යි.

ඥානයේ සීමා පැනවීම පිළිබඳ භාරතීය සංශයවාදීන් වූ අමරාවික්ඛේපවාදීන් ඉහත කී ත්‍රිවිධ සීමා පමණක් නොව, සදාචාරාත්මක සීමා ද අවධාරණය කොට ඇත. ඥානයේ සීමා පිළිබඳ විග්‍රහය ඉහත කී ආකාරයෙන් බෙදා දැක්වීම පිළිබඳ උගතුන් අතර

ඒකමතිකත්වයක් නොමැත. කෙසේ නමුත් ඥානයේ සීමා පිළිබඳ ඉහත කී ප්‍රස්තුත සතර තවදුරටත් අධ්‍යයනය කළ යුතු බව පෙනේ. මෙහි දී ප්‍රයෝගික සීමා යටතේ භෞතික ලෝකය නැතහොත් ආනුභවික විෂය ක්ෂේත්‍රය පිළිබඳ දැන ගැනීමට ඇති නොහැකියාවන් අදහස් කෙරේ. නෛසර්ගික සීමා යටතේ අදහස් කෙරෙන්නේ ඥානය ලබා ගැනීම පිළිබඳ මානවයා තුළ පවත්නා සහජ බාධාවන් ය. ඇතැම් විට මානසික සාධක ද මෙම මානව ඥානය පිළිබඳ ධාරිතාවයට බලපායි. තාර්කික සීමා යටතේ අදහස් කරන්නේ භාෂාවේ පවත්නා බාධාවන් ඥානයේ සීමා සඳහා කොතෙක් දුරට බලපාන්නේද? යන්න ගවේෂණය කිරීම යි. සදාචාරාත්මක සීමා ලෙස ගැනෙන සුවිශේෂ කරුණු තුළින් භාරතීයයන් ඥානයෙහි සීමා ආධ්‍යාත්මික පාරිශුද්ධිය සඳහා භාවිත කළ අයුරු සාකච්ඡා කිරීමට උපකාරී වන බව පෙනේ.

**5. ඥාන මීමාංසාවේ ප්‍රධාන ප්‍රස්තුත**

ඥාන මීමාංසාවේ සාකච්ඡා වන ප්‍රධාන ප්‍රස්තුත කිහිපයකි. ඒවා නම්,

1. ඥානය, ඥාන මීමාංසාව හා සත්‍ය
2. ඥාන මීමාංසාව හා විශ්වාසය
3. ඥානයෙහි සප්‍රමාණකත්වය
4. ඥානයෙහි වලංගුතාව
5. ඥාන කළමනාකරණය
6. ඥානයෙහි සාපේක්ෂතාව
7. ඥාන මීමාංසාව හා ආගම
8. පිළිඹිබුව හා යථාර්ථය යනු යි.

දැඩි අවිශ්වාසයේ පටන් දැඩි විශ්වාසය දක්වා පැතිර යන විශ්වසනීයත්වයේ තත්ත්ව පැවතෙන අතර ඥාන මීමාංසාව තුළ ඥානය හා විශ්වාසය රඳා පවතින්නේ නිසැක බව, ස්ථිර වීමට ඇති

අයිතිය හා කරුණුවල සත්‍යාසත්‍යතාව මත ය.[14] අනෙත් අතට ඥානය හා සත්‍ය මෙන් ම ඥානයෙහි සප්‍රමාණකත්වයට හා වලංගුතාවට ද එම සාධක (නිසැක බව, ස්ථිර වීමට ඇති අයිතිය හා කරුණුවල සත්‍යාසත්‍යතාව) බලපාන බව පෙනේ. ඥානයෙහි උචිත භාවිතය, යෙදවීම ප්‍රතිඵල උත්පාදනය ඥාන කළමනාකරණයෙන් සාකච්ඡා කරන අතර තත්ත්වයෙන් තත්ත්වයට පුද්ගල වෙමත්තතාව හා අභිරුචිය අනුව ඥානයෙහි ඒකත්වයක අභියෝගයට ලක්කිරීම ඥානයෙහි සාපේක්ෂකතාවයෙන් සාකච්ඡා කෙරේ. ක්‍රම විද්‍යාත්මක පදනමක් අනුව ඥාන මීමාංසාවට දොරගුළු විවර කරන ආගම් ද වේ. ආගම හා මිථ්‍යාව ද යථාර්ථය පාදක කරගත් ආගමික මෙහෙයවීම මෙන් ම අභිප්‍රේරණ ද (යථාභූත ඥාන දස්සන) ඥාන පූර්වක ආමන්ත්‍රණ ද මෙහි ලා සාකච්ඡා කෙරේ. පිළිඹිබුව සෑම විට ම යථාර්ථය නොවන බවට වන සාකච්ඡාව පිළිඹිබුව හා යථාර්ථය යටතේ සිදු කෙරෙන අතර ඥානය හා යථාර්ථය අතර පැවතිය යුතු සබඳතාව මෙහි දී අවධාරණය කෙරේ.

**6. ඥාන මීමාංසාවේ විෂය පථය**

දාර්ශනික ඥාන මීමාංසාව හුදෙක් අන්තර්ගතයක් ඇති විෂයක් නොවන අතර ඕනෑ ම විෂයක් ඇසුරෙන් ඥාන මීමාංසාව ගොඩනගා ගතහැකි බව ඉහත දී ද සාකච්ඡා කළ අතර ඒ අනුව දාර්ශනික විෂය ක්ෂේත්‍රවල එන තර්කය, සදාචාරය, මනෝවිද්‍යාව, ලෝකවිභාගය, අධිභෞතිකවිද්‍යාව, සෞන්දර්ය විද්‍යාව ඇතුළු විවිධ ධාරා ඔස්සේ මෙම විෂය සංවර්ධනය වන බව දැක්විය හැකි ය.

**7. ඥාන මීමාංසාවේ ගලායාම**

ඥානවිභාගයේ සාකච්ඡා ඉදිරියට ගෙනයනු වස් විග්‍රහ කළ යුතු දාර්ශනික ප්‍රස්තුත දෙකක් ගෙනහැර දක්විය හැකි ය. එනම්,

1. අප දැන ගන්නේ කුමක් ද?

2. අප දැන ගන්නේ කෙසේද?

අප දැන ගන්නේ කුමක් ද? යන ප්‍රශ්නය තවත් අයුරකින් පවසතොත් ලොව පවතින්නේ කවරක් ද? යන්න නැගිය හැකි ය. මෙයින් පැනෙන ප්‍රධාන සංකල්පය වනුයේ 'සත්වාදය' (Ontology) යි. මේ පිළිබඳව දාර්ශනික කතිකාවතක් ඇති කරගතහොත් ඉන් ලැබෙන ප්‍රතිඵල දෙකකි. එනම්,

1. විඥානවාදය (Idealism)

2. භෞතිකවාදය (Materialism)

අප දැන ගන්නේ කෙසේද? යන ප්‍රශ්නයේ දී ගොඩනැගෙන සංකල්පය නම් ඥානය පිළිබඳව න්‍යාය යන්න යි. මේ පිළිබඳව දාර්ශනික කතිකාවතක් ඇති කරගතහොත් ලැබෙන පිළිතුර අංශ දෙකකින් යුක්ත ය. එනම්,

1. අනුභූතිවාදය (Rationalism)

2. බුද්ධිවාදය (Empiricism)

ඥානය පිළිබඳව අනුභූතිවාද හා බුද්ධිවාදය තුළින් පැනෙන අදහස් සලකා බැලීම මෙහි දී අත්‍යවශ්‍යයෙන් ම කළ යුත්තකි. එයට හේතුව නම් යමක් දැනගැනීම සම්බන්ධයෙන් එසේත් නැත්නම් අප යමක් දැන ගැනීම සඳහා භාවිත කරන ක්‍රමවේද සඳහා අනුභූතිවාදය හා බුද්ධිවාදය යනාදිය වඩාත් වැදගත් වන හෙයිනි.

**6. බුද්ධිවාදය**

බටහිර මධ්‍යකාලීන ආගමික චින්තකයන් විසින් නතර කර තිබූ නිදහස් චින්තනය යළි හිස එසවීම බුද්ධිවාදයේ දාර්ශනික සම්ප්‍රදාය ආරම්භ වීම තුළින් සිදුවිය. බුද්ධිවාදය නම් ආදානග්‍රාහිත්වයෙන් තොරවීම විවේචනාත්මක ව කරුණු ඉදිරිපත් කිරීම, ගුප්ත ඥානමාර්ග නො පිළිගැනීම ආදි විවිධාර්ථ ලබා දීම තුළින් හැඳින්විය හැකි ය. එහෙත් බටහිර බුද්ධිවාද දාර්ශනික සම්ප්‍රදාය ඉහත කී අර්ථවලට වඩා ගැඹුරු අදහසක් දරූ බව පෙනේ. යුරෝපයෙන් නූතන දාර්ශනිකයන්ගෙන් බිහි වූ බුද්ධිවාදී සංකල්පවලට "මහද්වීපික බුද්ධිවාදය" (Continental Rationalism) හා "යුරෝපා බුද්ධිවාදය" (Europe Rationalism)

යනුවෙන් හඳුන්වයි. අනුභූතිය බැහැර කරමින් හුදු බුද්ධිය ප්‍රධාන කොටගත් ක්‍රමයකට ඥානය ගොඩනගා ගැනීමට උත්සාහ ගැනීම බුද්ධිවාදයේ ප්‍රධාන තේමාව යි.[15]

**බුද්ධිවාදයේ මූලික ලක්ෂණ අතර**

1. බුද්ධිය ඇසුරෙන් සියලු ම ඥාන සම්භාරයක් ගොඩ නැගෙන බව ප්‍රකාශ කිරීම[16]
2. සහජ සංකල්පවාදය ගෙනහැර දැක්වීම[17]
3. ප්‍රාගානුභූත ස්වභාවය ගෙනහැර දැක්වීම[18]
4. නිගාමී තර්කණ ක්‍රමය උපයෝගී කර ගැනීම[19]
5. ගණිතමය රීති සමඟ සබඳතාවයක් දැක්වීම[20]
6. තමා පිළිගත් පූර්වායවයෙහි සත්‍යාසත්‍ය බව සඳහා භෞතික ලෝකය පිළිබඳ ව සත්‍යෙක්ෂණය නො සලකා හරින බුද්ධිවාදීහු සත්‍යයේ මිනුම් දණ්ඩ වශයෙන් ''පැහැදිලිතාව" යන්න අවධාරණය කිරීම.[21] යනාදිය වැදගත් වේ.

බුද්ධිය මුල් කරගත් දාර්ශනික ලක්ෂණ බටහිර දර්ශනයේ අතීතයේ පටන් ම පවතින බව පෙනේ. ඉපැරණි ග්‍රීසියේ ජීවත් වූ බොහෝ දාර්ශනිකයන්ගේ දර්ශනයන් ද ඇතැම්විට බුද්ධිවාදී දර්ශන ප්‍රවාහය සමඟ සැසඳේ. ලෝකය ජලයෙන් නිර්මාණය වී ඇති බව ප්‍රකාශ කරන තේල්ස් එම නිගමනය කරා එළැඹී ඇත්තේ තම අවට ලෝකය දෙස බැලීමෙන් ලැබූ අත්දැකීම් පිළිබඳ ව බුද්ධිමය වශයෙන් කල්පනා කිරීම තුළිනි.[22] පාර්මනයිඩීස්, හෙරක්ලීටර්ස් ආදීහු ලෝකය නිරන්තරයෙන් වෙනස් වන බවත් එබැවින්, අනුභූතිය ඇසුරින් ලෝකයේ නියම තත්ත්වය දැකගත නොහැකි බවත් දක්වා ඇත.[23] සත්‍ය නො වෙනස් වන දෙයක් විය යුතු බවත් එය අවබෝධ කළ යුත්තේ බුද්ධියෙන් බවත් ඔවුන්ගේ පිළිගැනීම විය. පරමාණුවාදී අදහස් ලොවට හඳුන්වා දුන් ලියුකිපස් හා ඩිමොක්‍රිටස් ආදි ග්‍රීක දාර්ශනිකයන් ද එම පදාර්ථයන් දක්වා ගමන් කරනු ලැබුවේ බුද්ධිය පදනම් කරගත් ඥානයෙනි.[24] නූතන විද්‍යාව පරමාණු පිළිබඳ ව ගවේෂණමය

තත්ත්වයක් තුළ සිදු කෙරුණ ද ආරම්භයේ දී දාර්ශනිකයන් පරමාණු පිළිබඳ ව අදහස් දැක්වූයේ තාර්කික ව නැතහොත් බුද්ධිමය පදනමක් තුළිනි.

ග්‍රීක මහා දාර්ශනික සොක්‍රටීස් ද බුද්ධිවාදියෙකු ලෙස තර්ක කළ හැකි ය. මෙයට කදිම නිදසුනක් වන්නේ, ප්ලේටෝගේ කෘතියක සඳහන් වන "මීනෝ" නම් සංවාදයේ දී දැකිය හැකි ය. සිය මිතුරෙකුගේ නිවසට ගිය සොක්‍රටීස් එහි වහල්කම් කරන සේවකයා සමඟ ප්‍රශ්න කොට, ඔහු තුළ ගණිතය පිළිබඳ ව වූ මූලික සංකල්ප ඇති බව මෙහි දී පෙන්වා දෙන්නට විය. සෑම කෙනෙක් තුළ ම පවතින ඥානය මතු කිරීම ගුරුවරයාගේ කාර්යය බව සොක්‍රටීස් පෙන්වා දෙන්නේ බුද්ධිවාදී පදනමක් මතින් ය. ග්‍රීක මහා දාර්ශනික ප්ලේටෝ ද අනුභූතිය බැහැර කොට බුද්ධිය සිය ඥාන මාර්ගය වශයෙන් අගය කළ දාර්ශනිකයෙකි.[25] ස්ථිර පැවැත්මක් ඇති දේ පිළිබඳ ව ඥානය පමණක් සත්‍ය ඥානය වශයෙන් පිළිගන්නා ඔහු අනුභූතිමය පැවැත්ම අස්ථිර බවත් බුද්ධිමය ක්‍රමය මත පදනම් වූ ආකෘතිවාදය (The forms of the theory) ඉදිරිපත් කිරීම තුළින් ද මේ බව පැහැදිලි වේ. බටහිර දාර්ශනය පුරා විකාශනය වන මෙම දාර්ශනික ප්‍රවණතාව ප්‍රචලිත වන්නේ යුරෝපයේ දාර්ශනික යුගයක් වන නූතන යුගයේ දී ය. මෙහි පුරෝගාමීයා වන නූතන දර්ශනයේ පියා ලෙස සැලකෙන රෙනේ දේකාත් (ක්‍රි.ව.1596-1650) ද බෙනඩික්ට් ස්පිනෝසා (1632-1677) ද ගොඩ්ෆ්‍රිඩ් විල්හෙල්ට් ලයිබ්නිට්ස් (ක්‍රි.ව.1646-1716) ද බුද්ධිවාදී අදහස් දැක් වූ සුවිශේෂ දාර්ශනිකයන් වේ.

**7. අනුභූතිවාදය**

ග්‍රීක මධ්‍යතන යුගයේ ජීවත් වූ දේකාත් වැන්නන්ගෙන් යුරෝපය තුළ ගොඩනැගෙන නූතන දාර්ශනික අවධියේ බුද්ධිවාදයට එරෙහි ව ගොඩනැගෙන ප්‍රධාන ම දර්ශනිකවාදය අනුභූතිවාදය යි. යුරෝපයේ පුනරුදයෙන් පසු ප්‍රචලිත වූ ආනුභූතිවාදය තුළින් මිනිසුන් තාර්කිකවත්, විද්‍යාත්මකවත් සිතන්නට පෙලඹුණු බව පෙනේ. විද්‍යාවේ මූලික පදනම වන අනුභූතිය විද්‍යා ඥානයේ ප්‍රගමනයට ද හේතු වේ. එබැවින් අනුභූතිවාදය සමඟ මෙකළ විද්‍යාව ද සීඝ්‍රයෙන් දියුණු වන්නට විය.

අනුභූතිවාදයේ දී මූලික වශයෙන් ගෙනහැර දක්වන සංකල්පය නම් ඥානයේ උල්පත අනුභූතිය බව යි. එමෙන් ම එය තවත් විදියකින් දක්වුවහොත් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය ඇසුරෙන් ලෝකය පිළිබඳ ව ඥානය ගොඩනගා ගැනීම අනුභූතිවාදය යි. අත්දැකීම, දැන ගැනීම අනුභූතිය නම් වන්නේ ය. අනුභූතිය පදනම් කරගත් මෙම වාදය කලන්සූරිය අරුත් ගන්වන්නේ, "අනුභූතිවාදය වනාහී යථාභූතය පිළිබඳ ඥානයේ මිනුම් වශයෙන් අනුභවය පිළිගන්නා වාදය යි"[27] යනුවනි. අනුභූතියට පරිබාහිර ව සියලු ම ඥාන මාර්ග ප්‍රතික්ෂේප කරන මෙහි දී අධිකාරිය, ශ්‍රැතිය වැනි ඥාන මාර්ග බැහැර කරයි. අනුභූතියට ඥාන මාර්ගය ලෙස සැලකූ නූතන බටහිර දාර්ශනික යුගයේ දාර්ශනිකයන් අතර ජෝන් ලොක් (ක්‍රි.ව.1632-1714), ජෝර්ජ් බර්ක්ලේ (ක්‍රි.ව.1685-1753), ඩේවිඩ් හ්‍යූම් (ක්‍රි.ව.1711-1776) යනාදීන් වැදගත් වේ. මෙම අනුභූතිවාදය හැඳින්වීම සඳහා බ්‍රිතාන්‍ය අනුභූතිවාදය (British empiricism) යන්න ද භාවිත කරයි.

**අනුභූතිවාදයේ මූලික ලක්ෂණ අතර**

1. ඥානය අනුභූතිය ඇසුරෙන් ගොඩ නැගීම[28]
2. සහජ සංකල්පය ප්‍රතික්ෂේප කිරීම[29]
3. අසංස්ථිතිකභාවය තුළින් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂ සත්‍ය ලෙස ගැනීම[30]
4. මනස තුළ විවිධ සංකල්ප ගොඩනැගෙනුයේ ප්‍රත්‍යක්ෂ ඇසුරින් බව පෙන්වා දීම[31]
5. දෙවියන් හා සදාචාර සංකල්පය[32]
6. හේතුව හා ඵලය අතර ඇති සම්බන්ධතාව අභියෝගයට ලක් කිරීම[33]
7. අනුරූපතාවය හා උද්ගාමී තර්ක ක්‍රමය භාවිත කිරීම[34] යනාදිය වැදගත් වේ.

8. බෞද්ධ ඥාන මීමාංසාව

දාර්ශනික ඥාන මීමාංසාවේ සුවිශේෂතාවක් ලෙස බෞද්ධ ඥාන මීමාංසාව කෙරේ අවධානය යොමු කිරීම ද ඉතා වැදගත් ය. විශේෂයෙන් ඥානයෙහි පරමාර්ථය, ඥානයෙහි සීමා, ඥානයෙහි සාපේක්ෂතාව යනාදි සංකල්ප සම්බන්ධයෙන් බෞද්ධ ඥාන මීමාංසාව ප්‍රතිජානනාත්මක ආකල්පයක් දැරීම මෙහි දී මතුකළ හැකි ය. ක්‍රි. පූ. 6 වන සියවසයේ දී භාරතීය සමාජයේ පහළ වූ බුදුදහම එදා මෙදා තුර පොදු ජනයා අතර ජනප්‍රිය වී ඇත්තේ මෙලොවට හා පරලොවට යන දෙලොවට ම අදාළ වන, එසේ ම එම අදාළ වීම අර්ථවත් කරගැනීම සඳහා ජීවිතය තුළින් ක්‍රියාත්මක කළ හැකි ධර්මස්කන්ධයක් අන්තර්ගත විශිෂ්ට දහමක් නිසා ය. බුදුදහම වූ කලී හුදු විශ්වාස පද්ධතියක් හෝ ඇදහිලි සමූහයක් හෝ නොව, ක්‍රියාත්මක කිරීම සඳහා වන ක්‍රියාකාරකම් සමුදායකි. සත්වයාගේ මූලික ගැටලුව ලෙස සලකනු ලැබූ දුකත්, එය ඇතිවීමේ හේතුව, එය නැති කිරීම හා එසේ කිරීමේ මාර්ගය යන මේ සතර කරුණු සමස්ත බෞද්ධ චින්තනයෙහි හරය සේ සැලකිය හැකිය. භක්තික හා ඥානික යනුවෙන් දෙපරිදි කළ හැකි සමස්ත ආගම් පද්ධතිය අතුරෙන් බුදුදහම අයත් වන්නේ ඥානික ආගම් පාර්ශ්වයට ය.

බුදුරදුන් තමන් වහන්සේට පූර්වගාමී, හා සමකාලීන චින්තකයන් ඥානය ලබා ගැනීමට උපයෝගී කරගත් මාර්ග තුන් වැදෑරුම් කොට ගෙන හැර දක්වන ආකාරය මජ්ඣිම නිකායේ සංගාරව සූත්‍රයෙන් පැහැදිලි වේ.

1. ශ්‍රැතිය අධිකාරියෙහි ලා සැලකූ සම්ප්‍රදායවාදීන් (අනුස්සවිකා)
2. තාර්කිකයන්, අධිභෞතිකවාදීන් (තක්කී විමංසි)
3. අනුභූතිවාදීන් (තමන් අවබෝධ කර ගත් සත්‍යයන් හා තමන්ගේ ධර්මයන් ගැන පෞද්ගලික සත්‍යක්ෂණයකින් උසස් ඥානයක් ලැබූවන්

මෙම තෙවදෑරුම් ඥාන මාර්ග අතුරින් බුදුරදුන් තමන් වහන්සේ තෙවැනි ගණයට අයත් වන බව ප්‍රකාශ කර ඇත. බුදුරදුන්

තෝරා ගත් මෙම ඥාන මාර්ගය අනෙක් ඥාන මාර්ග අතුරින් පැහැදිලිව ම වෙනස් වන අතර ඥානය පිළිබඳ බෞද්ධ නිර්වචනය ද මෙහිදී ඉදිරිපත් වන බව පෙනේ. එබැවින් ඥානෝපායන් ලෙස ඉහත පළමුව දක්වූ අනුශ්‍රවයට මුල් තැන දුන් පිරිස (අනුස්සවිකා), හා දෙවනුව දක්වූ තර්කයට හා විමර්ශනයට මුල් තැන දුන් බුද්ධිවාදීන් (තක්කී වීමංසි) පිළිබඳ බෞද්ධ ආකල්පය සතුටුදායක නොවන බව පෙනේ. ලෝකය හා සත්ත්වයා පිළිබඳ යථාර්ථවාදී ඥානය ලබා ගැනීම ඉන්ද්‍රියානුබද්ධ මනසින් සිදු කළ හැකි බව පිළිගත් ඇතැමුන් අනුභූතිවාදය භාවිතා කොට තිබුණේ බුද්ධ කාලයටත් පෙරාතුව යි.

ප්‍රත්‍යක්ෂය ප්‍රධාන කොටස් දෙකකි. එනම්,

1. ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය

2. අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය, යනාදිය යි.

ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන ෂඩ් ඉන්ද්‍රියයන් මගින් ලබා ගන්නා දැනුම හෙවත් ඥානය ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය හෙවත් ඉන්ද්‍රිය ඥානය ලෙස දක්වේ. මිනිසා හා විශ්වය පිළිබඳ ෂඩ් ඉන්ද්‍රියන් ඇසුරු කොට තම තමන් දැන දැන ම නිරීක්ෂණය කොට ලබන ඥානය මේ යටතේ විවරණය කෙරේ. යෝගී ප්‍රත්‍යක්ෂය හුදෙක් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයයෙන් නොනවතී. එය මානසික වශයෙන් ප්‍රගුණ කිරීමට "භාවනා" යන්න භාවිත කරයි. ප්‍රාග් බෞද්ධයෝ පවා සමථය වඩා රූපාවචර, අරූපාවචර තත්ත්වයන් උපදවා ගත්හ. පෙර විසූ කඳ පිළිවෙළත් (පුබ්බේනිවාසානුස්සතිය) සත්ත්වයන් උපදින මිය යන ස්වභාවයක් (චූතුපපාත ඥානය) දැන ගැනීම දක්වා පැමිණි එම යෝගීවරුන්ගෙන් ඉදිරියට පැමිණි බුදුසමය අතීන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය භාවිත කොට පැමිණිය හැකි ඉහළ ම තලය වන සියලු ආසව ක්ෂය කිරීමේ ඥානය (ආසවක්ඛය ඥානය) උපදවා ගන්නා ආකාරය පෙන්වාදී ඇත.

බුදුන්වහන්සේ දේශනා කළ ධර්ම මාර්ගය පිළිපැදීම කළ යුත්තේ මූලික වශයෙන් ම අවබෝධයකින් අනතුරුව ය. දැනීමකින් තොරව බෞද්ධ ප්‍රතිපදා අනුගමනය කළ නොහැකි බව එහි අදහස වේ. බුදුරදුන් කිසියම් ස්ථානයකට යෑමේ ගමන් මග මුලින් ම සොයා ගන්නා ආදි පුරුෂයෙකුට සමාන බවත්, උන්වහන්සේ විසින්

දේශනා කරන ධර්මය ආදි-පුරුෂයෙක් තම ගමන් මග පිළිබඳ කරන විස්තරයකට හෙවත් තම ගමන් මඟ පිළිබඳව තබන වාර්තාවක් හා සමාන බවත්, ශ්‍රාවකයන් විසින් කළ යුත්තේ බුදුරදුන් විසින් අනුගත ගමන් මග අනුගමන කොට උන්වහන්සේ පැමිණි නිවනට පැමිණීම බවත් උන්වහන්සේ විසින් පෙන්වා දී ඇත. මෙවැනි නිදසුන්වලින් පැහැදිලි වන්නේ ධර්මය පිළිබඳ ඥානය, එය පිළිපැදීමේ පූර්ව අවශ්‍යතාවක් වන අයුරු යි.

මෙම කරුණ තව දුරටත් පැහැදිලි වන නිදසුනක් ලෙස බුදුසසුන හෙවත් බුදුරදුන්ගේ අනුශාසනය අංග තුනකින් සමන්විත වන අයුරු දැක්විය හැකි ය. එම අංග තුන නම් පරියත්ති සාසනය (පර්යාප්තිඃ සංස්කෘත), පටිපත්ති (ප්‍රතිපත්ති) සාසනය හා පටිවේධ (ප්‍රතිවේධ) සාසනය යි. මෙහි පරියත්ති යනුවෙන් සඳහන් වන්නේ බුද්ධ දේශනාව යි. ද්විතීයික අර්ථයකින් බුද්ධ දේශිත ධර්මය අන්තර්ගත ත්‍රිපිටකය ඉන් ගැනේ. ත්‍රිපිටකයෙහි අන්තර්ගත බුද්ධ දේශිත ධර්ම මාර්ගය ඉගෙනීම, ප්‍රගුණ කිරීම, අර්ථය තේරුම් ගැනීම වැනි අධ්‍යයන කාර්ය සම්පූර්ණ කිරීම පරියත්ති සාසනය වේ. පටිපත්ති යනුවෙන් අදහස් කෙරෙනුයේ එසේ හදාරන ලද ධර්මය පිළිපැදීම හෙවත් අනුගමනය කිරීම යි. පටිවේද සාසනය නම් ධර්මය පිළිපැදීම තුළින් මාර්ග, ඵල හා නිවන ප්‍රත්‍යක්ෂ කරගැනීම හෙවත් අවබෝධයෙන් අත්පත් කර ගැනීම යි. ශාසනයෙහි ත්‍රිවිධ අංග පිළිබඳ මෙම විවරණයෙන් පැහැදිලි වන්නේ ධර්මය අධ්‍යයනය කිරීම බෞද්ධ ආගමික ප්‍රතිපදාවෙහි ආරම්භක පියවර බව යි. පහත සඳහන් දේශනා පාඨයෙන් මෙම කරුණ තවදුරටත් පැහැදිලි වේ.

ශ්‍රද්ධාව ඇති වූ පුද්ගලයා (බුදුරදුන් වෙත) එළඹේ. එළඹ සමීපයෙහි හිඳියි. සමීපයෙහි හිඳ කන් යොමු කරයි. යොමු කළ කන් ඇත්තේ ධර්මය අසයි. අසා ධර්මය මතක තබා ගනී. මතක තබාගත් ධර්මවල අර්ථය පරීක්ෂා කරයි. අර්ථය පරීක්ෂා කරන්නහුට ධර්ම වැටහේ. ධර්ම වැටහිම ඇත්තහුට ඡන්දය (ක්‍රියා කිරීමට ඇති කැමැත්ත) ඇති වේ. ඡන්දය ඇති වූ කල්හි උත්සාහ කරයි. උත්සාහ කොට තුලනය කරයි. තුලනය කරමින් භාවනානුයෝගී වේ. භාවනානුයෝගී වූ විට නාම කායයෙන් පරම සත්‍ය ප්‍රත්‍යක්ෂ කරයි. එය ප්‍රඥාවෙන් පිරිසිඳ දකී. (කීටාගිරි සූත්‍රය, මජ්ඣිමනිකාය II, බු.ජ.සං, 248 පිටුව)

මෙහිදී පර්යාප්ති - ප්‍රතිපත්ති - ප්‍රතිවේධ යන අංගත්‍රයයෙන් සමන්විත ශාසනික ප්‍රතිපදාව අන්තර්ගත වන බව පෙනේ. එසේම ධර්මය අසා, මතක තබාගෙන, අර්ථ විමසීමේ ක්‍රියාදාමය හෙවත් ධර්ම අධ්‍යාපනය ධර්මාවබෝධයෙන් අවසාන වන අයුරු ද මින් පැහැදිලි වේ.

මෙහි දක්වන ලද ක්‍රියාදාමය බෞද්ධ සාහිත්‍යයෙහි සඳහන් තුන් ආකාර වූ ප්‍රඥාව පිළිබඳ වර්ගීකරණය හා ද මනා ලෙස ගැලපෙන බව පෙනේ. දීඝ නිකායෙහි සංගීති සූත්‍රයෙහි සඳහන් පරිදි සුතමය පඤ්ඤා, චින්තාමය පඤ්ඤා, භාවනාමය පඤ්ඤා යනුවෙන් ප්‍රඥාව තෙවැදරුම් වේ. එහි සුතමය පඤ්ඤා යනු බහුශ්‍රැතභාවය යි. ඇසීමෙන් හෙවත් වර්තමානයෙහි බහුලව දක්නට ලැබෙන පරිදි කියවීමෙන් හෝ දැකීමෙන් ලැබෙන ඥානය යි. මෙම ඥානය මූලික වශයෙන් ම තොරතුරු තුළින් ලැබෙන්නකි. චින්තාමය පඤ්ඤා හෙවත් සිතීමෙන් ඇතිවන නුවණ ය. ඉහතින් දැක්වූ කීටාගිරි සූත්‍රයෙහි ද සඳහන් වන පරිදි අසන ලද්දෙහි අර්ථය පරීක්ෂා කිරීම, තුලනය කිරීම ආදියෙන් ඇතිවන නුවණට සමාන ලෙස සිතිය හැකි ය. අවසානයේ දී සඳහන් භාවනාමය ප්‍රඥාව කීටාගිරි සූත්‍ර දේශනාවෙහි සඳහන් භාවනානුයෝගීත්වය තුළින් ලැබෙන සත්‍යය පිළිබඳ ප්‍රත්‍යක්ෂය සේ සැලකිය හැකි ය. බුදුදහම අගයන ධර්ම ඥානය පිළිබඳ දරන ලද මෙම ප්‍රායෝගිතාවාදී ආකල්පය දරන්නේ සීමා සහිත පදනමකි. එම අදහස පහත සඳහන් ධම්මපද ගාථාවලින් මනා ලෙස පැහැදිලි වේ.

''බහුම්පි චෙ සහිතං භාසමානො

න තක්කරො හොති නරො පමත්තො

ගොපොව ගාවො ගණයං පරෙසං

න භාගවා සාමඤ්ඤස්ස හොති.''

''අප්පම්පි චෙ සහිතං භාසමානො
ධම්මස්ස හොති අනුධම්මචාරී
රාගඤ්ච දොසඤ්ච පහාය මොහං
සම්මප්පජානො සුවිමුත්ත චිත්තො
අනුපාදියානො ඉධවා හුරංවා
ස භාගවා සාමඤ්ඤස්ස හොති.'' (ධම්මපද 19 - 20)

සාහිත්‍යය (ධර්මය) බොහෝ කොට කියන්නේ නමුදු, ඒ අනුව පිළිනොපදින ප්‍රමාද වූ මිනිසා අනුන්ගේ ගවයන් ගණින්නා වූ ගොපල්ලෙකු මෙන් පැවිද්දෙහි කොටස් කරුවෙකු බවට පත් නොවේ.

සාහිත්‍යය (ධර්මය) ස්වල්පයක් කියන්නේ නමුදු, ධර්මයට අනුව හැසිනේනා වූ රාග, දෝස, මෝහ දුරු කොට මනා වු ප්‍රඥාවෙන් යුතුව, මනාව මිදුණු සිතැතිව, මෙලොව හෝ පරලොව ග්‍රහණය නො කරන්නා වු පුද්ගලයා පැවිද්දෙහි කොටස් කරුවෙක් වේ.

මෙම ගාථාවලින් පැහැදිලි වනුයේ හැදෑරීම අවශ්‍ය වනුයේ ප්‍රතිපත්ති පූරණය සඳහා බවත්, ශාසනික සන්දර්භය තුළ වඩාත් වැදගත් වන්නේ හුදෙක් ධර්මය හැදෑරිම ම නොව, එමගින් ධර්මාවබෝධය කිරීම බවත් ය.

ධර්මය හැදෑරීම පිළිබඳ දක්නට ලැබෙන මෙම ආකල්පය අප විසින් නිවැරදිව තේරුම් ගැනීම වැදගත් ය. ධර්මය හැදෑරීමෙන් ලැබෙන ධර්මඥානය ඉතා වැදගත් වුවත්, එය හුදෙක් මාධ්‍යයක් හෙවත් කිසියම් අරමුණක්, ඉටුකර ගැනීමේ ක්‍රමෝපායයක් ලෙස පමණක් වැදගත් වීම අපගේ සැලකිල්ලට ලක්විය යුතු ය. ලෝකය දෙස සාමාන්‍යයෙන් බලන විට පෙනෙන කරුණක් නම් ඥානය කෙරෙහි දක්වන දැඩි අවධානය යි. මෙහි දී ඥානය හුදෙක් මාධ්‍යයක් ලෙස නොව අන්තයක් ලෙස හෙවත් පරම නිෂ්ඨාවක් ලෙස සලකනු ලබන බව පෙනේ. එබඳු ඥානයකින් යුත් පුද්ගලයා උගතෙකු ලෙස සැලකෙන අතර, ඔහු හෝ ඇය සමාජ සම්භාවනයට ද පාත්‍ර වේ.

එහෙත් බුදුසමය දෙස බලන විට මෙම කරුණ වඩාත් සංකීර්ණ බව පෙනේ. ධර්ම ඥානය කොතරම් වැදගත් වුවත්, හුදු උගත්කමට වඩා ශිලය හෙවත් ප්‍රතිපත්තිකාමී ජීවිතය බෞද්ධ සම්ප්‍රදාය තුළ අගය කෙරේ. මෙයට අදාළ අගනා කරුණක් මජ්ඣිම නිකායෙහි අලගද්දූපම සූත්‍රයෙහි (22) සඳහන් වේ.

''මහණෙනි, මේ ශාසනයේ ඇතැම් හිස් පුරුෂයෝ සුත්ත, ගෙය්‍ය, වෙය්‍යාකරණ, ගාථා, උදාන, ඉතිවුත්තක, ජාතක, අබ්භූතධම්ම, වෙදල්ල යන ධර්ම උගනිත්. ඔවුන් ඒ ධර්මය ඉගෙන ඒ ධර්මයන්ගේ අර්ථය ප්‍රඥාවෙන් පරීක්ෂා නොකරත්. නුවණින් අදහස මෙනෙහි නොකරන්නා වූ ඔවුන්ට ඒ ධර්ම මැනැවින් නොවැටහේ. ඔවුන් ධර්මය හදාරනුයේ අනුන්ට දොස් පැවරීමටත්, (අනුන්ට වාද කොට) ඉන් මග හැරීමටත්ය. ඔවුහු ධර්මය හැදෑරීමේ නිසි ප්‍රයෝජනය නොලබත්. වරදවා ගන්නා ලද එම ධර්ම ඔවුන්ට බොහෝ කාලයක් අහිත හා දුක් පිණිස හේතු වේ. එයට හේතුව කිම? එම ධර්ම වැරදි ආකාරයෙන් ගන්නා ලද බැවිනි.''

මෙහි සඳහන් පරිදි ධර්මය හැදෑරීම අත්තුක්කංසනය හා පරවම්භනය පිණිස කෙරේ නම් ඉන් වන්නේ අවැඩකි. ධර්මය පිළිබඳ එබඳු දැනීම් හුදෙක් සර්පයකු වල්ගයෙන් අල්ලා ගැනීම හා සමාන කොට (අලගද්ද + උපමා) මෙම සූත්‍රයේ දක්වා ඇත. වලිගයෙන් අල්ලා ගත් විට සර්පයා ආපසු හැරී අල්ලාගත් පුද්ගලයාට පහර දෙන්නාක් මෙන් වැරදි ලෙස ගන්නා ලද ධර්මය (ධර්මඥානය) කරණ කොට ගෙන එසේ ගන්නා ලද පුද්ගලයා ද විනාශයට පත්වේ.

මෙබඳු නිදසුන්වලින් පැහැදිලි වන්නේ බෞද්ධ චින්තනය තුළ ඥානය හෙවත් උගත්කම කෙතරම් උසස් ලෙස සලකනු ලැබුව ද, එය එක ම අවශ්‍යතාව ලෙස නො සලකන ලද බව යි. ''සුනාථ ධාරෙථ චරාථ ධම්මෙ" (රසවාහිනී) යන සුප්‍රකට පාඨයෙන් පෙන්වා දී ඇති පරිදි ධර්මය ඇසීම හා දැරීම (ධාරණය කිරිම හෙවත් මතක තබා ගැනීම) අවශ්‍ය වනුයේ ධර්මය පිළිපැදීම සඳහා ය. "ඥානය හුදෙක් ඥානය සඳහාය" යන්න බුදුදහම තුළ නො පිළිගන්නා බව පෙනේ.

## ආන්තික සටහන්

1. එදිරිසිංහ දයා, පෙරේරා ඥානදාස, *දාර්ශනික විමර්ශන*, වත්මා ප්‍රකාශකයෝ, දෙහිවල, 2001, පි. 01.
2 ධම්මානන්ද හිමි හෝමාගම, *බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය*, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2004, පි. 67.
3. ධම්මානන්ද හිමි හෝමාගම, *බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය*, එම, පි. 172.
4. ධම්මගරු හිමි, උස්ගොඩ, ඥාන, *සිංහල විශ්වකෝෂය 13*, සංස්කෘතික අමාත්‍යාංශය, පිටු 518.
5. එම, පි. 712.
6. ඉලංගකෝන් සමන්ත, *චින්තන ධාරා*, සමන්ති පොත් ප්‍රකාශකයෝ, ජාඇල, 2007, පි. 12.
7. ධම්මගරු හිමි, උස්ගොඩ, *සිංහල විශ්වකෝෂය 13*, එම, පිටු 594.
8. වීරවර්ධන සුමේධ, ලිපිය: ඥානවිභාගය යනු කුමක්ද?, *සම්භාෂා 14 වැනි කලාපය*, සංස්: ඥානරතන හිමි වලස්වැවේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙණ අධ්‍යාපන ශාඛාව, බත්තරමුල්ල, 2006, පි. 712.
9. වීරවර්ධන සුමේධ, ලිපිය: ඥානවිභාගය යනු කුමක්ද?, *සම්භාෂා 14 වැනි කලාපය*, එම, පි. 712.
10. විජිත හිමි, කුඩාකත්නෝරුවේ, ලිපිය: බුදු සමය හා අනුභූතිවාදය, *චරණ මංගල කලාපය*, සංස්: පඤ්ඤාරතන හිමි, මඩවලතැන්නේ, චන්ද්‍රවිමල හිමි කත්තකඩුවේ, භික්ෂු සංගමය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, 2008, පි. 51
11. ධම්මානන්ද හිමි හෝමාගම, *බෞද්ධ හා කාන්ටියානු සදාචාර දර්ශනය*, එම, පි. 172.
12. විජයබණ්ඩාර චන්දිම, මොරටුවගම එච්.එම්, *බෞද්ධ චින්තනය*, ජයතිලක දෘෂ්ටිය, මහාචාර්ය කේ. එන්. ජයතිලක සමරු සංවිධානයේ ප්‍රකාශනයකි, රාජගිරිය, 1995, පි. 13.
13. අබේවංශ කපිල, *ඉමැනුවෙල්කාන්ට්ගේ ඥාන විභාගය, බෞද්ධ චින්තනය ඇසුරින් කෙරෙන අධ්‍යයනයක්*, පාලි හා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, 1997, පි. 01.
14. බිබිලේ, ඩී.පී., ඥානය හා විශ්වාසය, *සිංහල විශ්වකෝෂය 13*, එම, පිටු 592.
15. එදිරිසිංහ, දයා., පෙරේරා, ඥානදාස., *දාර්ශනික විමර්ශන*, එම, පි. 12.
16. බුද්ධිය නම් සත්‍යය යි. එය වෙනස් නොවේ. එහෙත් අනුභූතිය ඇසුරින් ගොඩ නැගෙන ඥානය ස්ථිරතාවයෙන් තොර බව බුද්ධිවාදීහු පෙන්වා දෙති. ඉටි

කැබැල්ලක් රත් කිරීමේ දී එය කලින් පැවති හැඩයෙන් වෙනස් වෙන බව පෙන්වා දෙන දේකාර්ත් ප්‍රත්‍යක්ෂය තුළින් අප ලබන ඥානය ස්ථිර නො වන බැවින් එය බැහැර කළ යුතු බව පෙන්වා දී ඇත. එබැවින් නිවැරදි ම ඥානය බුද්ධිය ඇසුරින් ලබාගත යුතු ය. මේ තුළින් දේකාත් නම් දාර්ශනිකයා සැකය, කාටිසියානු ද්විත්වවාදය ආදිය ද ලයිබ්නිට්ස් දෙවියන් වහන්සේ, තන්මාත්‍ර ආදි ඉගැන්වීම් ද බුද්ධිවාදය තහවුරු කොට ඇත. දාර්ශනික ඉතිහාසය තුළ දේකාර්ත් දක්වා යම් යම් ආකාරයෙන් පළ වූ මත ඒකත්වයක් පිළිබිඹු කළ ද දේකාර්ත් එය ද්විත්වවාදය (Dualism) දක්වා පරිවර්තනය කළ අතර පසුව ස්පිනෝසා ද, ලයිබ්නිට්ස් ද ඒකත්වවාදයක් අවධාරණය කොට ඇත.

17. මිනිස් මනය තුළට උපතින් යම් යම් සංකල්පය ඇතුළත් වන බව බුද්ධිවාදීන්ගේ ප්‍රධාන සංකල්පයකි. මෙයට උදාහරණ වශයෙන් ඉදිරිපත් කළ යුත්තේ "දෙවියන් වහන්සේ" "ආත්මය" වැනි සංකල්ප යි. මෙම සංකල්ප පුද්ගල මනස තුළ පවතින්නේත් ඒවා සත්‍ය වන්නේත් සහජයෙන් ම ඒ පිළිබඳව ඥානයක් ඇති නිසා බව බුද්ධිවාදිහු පිළිගනිති. ලෝකයේ ඇති සියලු ම දේ ගැන සැක කළ දේකාත් දෙවියන් සැකයකින් තොර බව අවසානයේ දක්වන්නේ එබඳු සංකල්පයක් සහජයෙන් පුද්ගල මනසේ අන්තර්ගත වන බව පිළිගත් නිසා ය. මෙසේ තමන් තුළ පවත්නා දෙවියන් පිළිවෙළ සහජ සංකල්පය සර්ව සම්පූර්ණ සංකල්පයක් සේ දකින දේකාත්, අවසානයේ දී සර්ව සම්පූර්ණ සත්ත්වයෙකු පැවතිය යුතු බවත් ඒ දෙවියන් වහන්සේ බවත් ප්‍රකාශ කරන්නට විය. සහජ සංකල්පය බුද්ධිවාදය ගොඩනැගීමට පෙර සිට ම එන සංකල්පයකි. ග්‍රීක දාර්ශනිකයෙක් වන සොක්‍රටීස් පවා සහජයෙන් ම පුද්ගලයා තුළ ඇති හැකියාව පිළිගනී.

18. බුද්ධිවාදයේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ ප්‍රාගානුභූත ස්වභාවය ගෙනහැර දැක්වීම යි. එක්තරා ආකාරයකට බුද්ධිවාදය නම් ප්‍රාගානුභූත විශ්ලේෂණයකි. බාහිර ලෝකයේ කරුණු අවධාරණය කිරීමක් මෙමගින් සිදු නො වන අතර අදාළ ප්‍රස්තුතයන්ගේ ගැළපීම මත ඥානය ගොඩනැගිය හැකි බව මෙමගින් පිළිගැනේ. මේ තුළින් ලබා ගන්නා ඥානය අවශ්‍ය සත්‍යය වශයෙන් ගම්‍ය වන බව පැවසේ. ඊට හේතුව නම් එම ප්‍රස්තුතවල ප්‍රාගානුභූත ස්වභාවය අන්තර්ගත වීම යි.

උදා :- සියලු මිනිසුන් මැරෙන සුලු ය.

සොක්‍රටීස් මිනිසෙකි.

සොක්‍රටිස් මැරෙන සුලු ය.

මෙම ප්‍රස්තුතයේ නිගමනය අවශ්‍ය සත්‍යයක් වී ඇත්තේ එය බාහිර ලෝකයේ කරුණු සමඟ ගැළපෙන නිසා ම නොව, අවිසංවාදී ආකාරයෙන් නිගමනය ලබා ගෙන ඇති නිසා ය.

19. බුද්ධිවාදීන් සිය සංකල්පය ගෙනහැර දැක්වීමට භාවිත කළේ නිගාමී තර්කණය යි. එහෙත් අනුභූතිවාදීන් සිය තර්කණය කර ගත්තේ උද්ගාමී ක්‍රමය වන අතර

එම තර්කන ක්‍රමය බුද්ධිවාදීන් දැඩි සේ විවේචනය කොට ඇත. උද්ගාමී ක්‍රමය ඇසුරෙන් ගොඩනැගෙන සම්භාවිතාවෙන් යුතු සත්‍යයට වඩා නිගාමී ක්‍රමය ඇසුරෙන් ගොඩනැගෙන්නේ අවශ්‍ය සත්‍යය බව බුද්ධිවාදීන් පිළිගනී.

උදා :- සියලු තාර්කිකයෝ මැරෙන සලු ය.

ඇරිස්ටෝටල් තාර්කිකයෙකි.

ඇරිස්ටෝටල් ද මැරෙන සුලු ය.

20. ගණිතමය ක්‍රමය සම්බන්ධයෙන් බුද්ධිවාදීන් දක්වනුයේ විශේෂ ලැදියාවකි. බුද්ධිවාදී දාර්ශනිකයන් බොහෝ දෙනෙක් ගණිතඥයන් වීම තුළින් මේ බව පැහැදිලි වේ. දේකාත්, ස්පිනෝසා, ලයිබ්නිට්ස් ආදී දාර්ශනිකයෝ සිය දාර්ශනික ප්‍රස්තුත සඳහා ගණිතමය රීතීන් උපයෝගී කර ගනිති. ගණිතමය රීතීන් ඇසුරෙන් එන නිගමන බුද්ධිමය වශයෙන් ලබා ගන්නා ඒවා ය. සත්‍ය ස්වභාවය මෙය ගණිතමය ක්‍රමය ඇසුරෙන් නිරූපණය වන බව බුද්ධිවාදීහු පිළිගනිති.

21. කලන්සූරිය, ඒ. ඩී. පී., *දර්ශනය හැඳින්වීමක්*, 49.

22. විදානගමගේ, කුලසේන., *දාර්ශනික ගැටලු*, පි. 37.

23. එම, පි. 37.

24. එම, පි. 38.

25. එම, පි. 38.

26. සොයිසා, ඒ. පී. ද., *ධර්ම සමය සිංහල ශබ්ද කෝෂය*, පි. 125.

27. කලන්සූරිය, ඒ. ඩී. පී., *නූතන බටහිර දර්ශනය*, පි. 94.

28. සියලු ම ඥානයන් අනුභූතිය ඇසුරින් ගොඩනැගෙන බව මෙමගින් පෙන්වා දේ. අනුභූතියේ සීමාව ඥානයේ සීමාව ලෙස මෙහිදී පිළිගනියි. අනුභූතිවාදීන් පෙන්වා දෙන්නට වූයේ ඥානයට අවශ්‍ය මූලික ම දේ පංචේන්ද්‍රයන් මගින් ලබා ගන්නා අත්දැකීම බව යි. මෙහි අභ්‍යුපගමනය වන්නේ බාහිර ලෝකයෙන් ලබන අනුභූතිය ඇසුරෙන් ම ඥානය සඳහා අවශ්‍ය මූලික පදනම ගොඩ නැගෙන බව යි. "පැවැත්ම යනු ප්‍රත්‍යක්ෂය යි" යන බාර්ක්ලේගේ ප්‍රකාශය මීට නිදසුනකි. එහි දී ඔහු තවදුරටත් පෙන්වා දෙන්නේ "මට ප්‍රත්‍යක්ෂ නො වන විට හෝ මාගේ මනසේ නො පවතින විට හෝ දෙවියන් වහන්සේ නොපවතින විට හෝ යමකට නැත්තේ ය" යන්න යි. ද්‍රව්‍ය හා වස්තූන්ගෙන් පැවැත්ම ප්‍රත්‍යක්ෂය මතය යන්න තහවුරු කිරීමට අනුභූතිවාදීන් ගන්නා ප්‍රයත්නය තුළ අසංස්ථිතික භාවයක් ගොඩනැගීමට ද හේතු වේ.

29. බුද්ධිවාදීන්ගේ මූලික ප්‍රකාශයක් වන සහජ සංකල්පය අනුභූතිවාදීහු බැහැර කරති. අතීත සිද්ධියක් පිළිබඳ ව කල්පනා කරන විට දී පවා අතීත අනුභූතීන් වැදගත් වන බව ඔවුහු පෙන්වා දෙන්නට දෙති. ජෝන් ලොක් වැන්නන් මනස පිරිසිදු පුවරුවකට සමාන කිරීමෙන් උත්සාහ ගත්තේ ද සහජ සංකල්පය බැහැර කිරීමට යි.

30. මෙහිදී අදහස් කරනුයේ අසංස්ථිතිකතාවත් ගොඩනැගී තිබුණ ද ඥානය ලෙස අනුභූතිවාදීන් ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය යොදා ගැනීම යි. ද්‍රව්‍යයන්ට අයත් වස්තුවල ගුණ ප්‍රාථමික හා ද්විතීයික වශයෙන් කොටස් දෙකකට බෙදන ජෝන් ලොක් ප්‍රාථමික ගුණ ඉන්ද්‍රියන්ට ගෝචර නොවන බව ප්‍රකාශ කළේ ය. එහෙත් මෙම ප්‍රාථමික ගුණයන් ඇසුරින් ඇති වන දෙය ප්‍රත්‍යක්ෂය ලෙස සාපේක්ෂ ව ලබා ගන්නා බව දක්වයි.

31. සරල හා සංකීර්ණ වශයෙන් දෙයාකාර වන සංකල්පවලින් සංකීර්ණ සංකල්ප ගොඩනැගෙනුයේ සරල සංකල්ප ඇසුරෙන් බව අනුභූතිවාදීන්ගේ අදහස යි. මෙහි දී සරල සංකල්ප වර්ණය, හැඩය වැනි ඍජු ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂයෙන් ඇසුරෙන් ගොඩ නගන අතර මේසය, පුටුව වැනි සංකල්ප එම සරල සංකල්ප ඇසුරෙන් ම ගොඩ නැගෙන බව පිළිගෙන ඇත. බුද්ධිවාදීන් ඉදිරිපත් කරන සහජ සංකල්පයට පටහැනි වීමක් මේ තුළ දක්නට ලැබේ.

32. මධ්‍යතන යුගයේ පැවති දේව අධිකාරි සංකල්ප අනුභූතිවාදීන් සම්පූර්ණයෙන් බැහැර නො කරයි. එහෙත් දෙවියන් සදාචාරය වැනි සංකල්ප බුද්ධිවාදීන්ට වඩා වෙනස් ස්වරූපයකින් අනුභූතිවාදය තුළ ඉදිරිපත් විය. බුද්ධිවාදීන්ට අනුව දෙවියන් වහන්සේ, සදාචාරය වැනි සංකල්ප පුද්ගලයාට සහජයෙන් ම ඇති වේ. මෙම මතය බැහැර කරන අනුභූතිවාදීන් සහජ සංකල්පය සර්වව්‍යාපී නම් ලෝකය තුළ ළමයින් මන්දබුද්ධික ව හා සුවිශේෂ බුද්ධියකින් යුතු ව යනාදී වශයෙන් උපත නො ලැබිය යුතු ය.

    මේ අනුව අනුභූතිවාදීන් පෙන්වා දෙන්නේ පුද්ගලයා තමා ජීවත් වන පරිසරය ඇසුරෙන් ලබන අනුභූතීන් මත මේ සියලු ම දේ පිළිබඳ ව සංකල්ප ගොඩ නගා ගන්නා බව යි. දෙවියන් හෝ වෙනත් සදාචර සංකල්ප පිළිබඳව හෝ පුද්ගලයාට අවබෝධයක් ලැබෙනුයේ ඒ සම්බන්ධ ව ඔහු ලබන ඉගෙනුම හෝ අත්දැකීම මත ය.

33. සහජ සංකල්පය ආදිය හරහා බුද්ධිවාදීන් තහවුරු කරන හේතුඵල සබඳතාව අවශ්‍ය සබඳතාවක් ලෙස පෙන්වා දී ඇත. විද්‍යාත්මක ඥානය ගොඩනගා ගන්නා මූලික ම පදනම වන හේතුඵල සබඳතාව අභියෝගයට ලක් කරන හ්‍යූම් වැන්නන් පෙන්වා දෙනුයේ හේතුව හා ඵලය යන්න අත්දැකිය නො හැක්කක් වන අතර එය හුදෙක් සිතිවිල්ලක් ම වන බව යි. උදාහරණයක් ලෙස "ගඟ ගොඩ ගලයි", "සතුන් මැරෙයි" මෙම ප්‍රකාශවල හේතුඵලතාවයක් ඇතැයි කීමට වඩා මෙහි ඇත්තේ සිද්ධි දෙකක් පමණක් බව අනුභූතිවාදී චින්තනයෙහි අදහස යි.

34. අනුභූතිවාදීන් සත්‍යයේ මිණුම ලෙස භාවිත කරනුයේ අනුරූපතාව යි. බුද්ධිවාදීන් කී පරිදි අනුසන්ධානය ඇසුරෙන් සත්‍ය කරා එළැඹීම ප්‍රතික්ෂේප කරන මොවුහු බාහිර ලෝකයේ කරුණු සමඟ සම්බන්ධ වීමේ අවශ්‍යතාව පෙන්වා දෙති. නිගාමී තර්ක ක්‍රමය බැහැර කරමින් උද්ගාමී තර්ක ක්‍රමය තුළින් ඥානය ගොඩනගා ගන්නට අනුභූතිවාදීන් උත්සාහ ගන්නේ මෙම පදනම මත ය. පශ්චාද් අනුභූත සංශ්ලේෂී ප්‍රස්තුත ලෝකය පිළිබඳ ව කරුණුවලට සම්බන්ධ

වන බැවින් ඒවා අවබෝධ වන ක්‍රමයක් ලෙස උද්ගාමී තර්ක ක්‍රමය අවධාරණය කරයි. මෙම ක්‍රමයට අනුව නිවැරදි ඥානය, ප්‍රත්‍යක්ෂය වන බව අනුභූතිවාදීහු පෙන්වා දෙති.

ඥානය පිළිබඳ අනුභූතිවාදී හා බුද්ධිවාදී අදහස් පැහැදිලි කරන විට ඉමැනුවෙල් කාන්ට්ගේ දර්ශනය ද සුවිශේෂ වෙයි. බුද්ධිවාදීන් හා අනුභූතිවාදීන් ගෙනහැර දක්වන දාර්ශනික සංකල්ප හුදෙක් අන්තවාදී යැයි සිතන කාන්ට් ප්‍රායෝගික ඥානවිභාගයක පෙර නිමිති දැකීමට උත්සාහ ගන්නේ බුද්ධිවාදයේත් අනුභූතිවාදයේත් තවත් පියවරක් ඉදිරියට තබමිනි. මනුෂ්‍ය ඥානය ඉන්ද්‍රිය අනුභූතියන් ආරම්භ වන නමුත් එය අනුභූතිය තුළට පමණක් සීමා නොවන බව කාන්ට්ගේ අදහස යි. අපගේ ඥානයේ එක් කොටසක් ඉන්ද්‍රිය අනුභූතියට ප්‍රථම ව හෙවත් ප්‍රාග් අනුභූතික ව ඇති වන බව කාන්ට් විශ්වාස කරයි. කාන්ට්ගේ මෙම ඉගැන්වීමත් සමඟ බුද්ධිවාදය හා අනුභූතිවාදය පිළිබඳ මතවාද හුදු මතවාද ලෙස ම ශේෂ වූ බව පෙනේ.